රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 21/2006

මගේ අංකය:ආ/4/3/1/14-1
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2006.12.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල තාවකාලික, අනියම්, ආදේශක සහ කොන්ත්‍රාත් පදනම මත**
**බඳවාගත් සේවකයන් ස්ථිර කිරීම**

රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල 2005.12.31 දින දක්වා ක්‍රියාත්මක වූ සේවක වර්ගීකරණය අනුව කණිෂ්ඨ සේවක ශ්‍රේණීන් ලෙස සලකන ලද තනතුරුවලට තාවකාලික, අනියම්, ආදේශක සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති සේවකයන් පහත සඳහන් අවශ්‍යතා සපුරන්නේ නම් 2006.11.01 දින සිට සේවයේ ස්ථිර කිරීමට රජය තීරණය කර ඇත.

I. අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තිබිය යුතුය.

II. අනුමත සේවක සංඛ්‍යාවට අයත් දැනට පුරප්පාඩුව පවත්නා ස්ථිර තනතුරේ 2006.11.01 දිනට (වැඩකරන) දින 180 ක් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව සේවය කර තිබිය යුතුය. රජයේ නිවාඩු දින හා ප්‍රසිද්ධ නිවාඩු දිනවල සේවය කළයුතු තනතුරක සේවය කරන නිලධාරියෙකු එම දිනවල සේවය කල දිනයන් දින 180 ගණනය කිරීමේදී අදාළ කරගත යුතුවේ.

III. තනතුරට අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතුය.

IV. 2002.10.01 සහ 2002.10.24 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 16 සහ 16(1) නිකුත් කිරීමෙන් පසුව ඉහත පදනම මත කරන ලද පත්කිරීමක් නම් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියක් ලැබී තිබිය යුතුය.

V. මේ යටතේ ස්ථිර කිරීමට සුදුසුකම් ලබන සේවකයන්ගේ වයස 2006.11.01 දිනට අවු.45 ඉක්මවා තිබුණද ඔවුන් තාවකාලික, අනියම්, ආදේශක සහ කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගන්නා අවස්ථාවේදී වයස අවු.45 ඉක්මවා නොතිබුණේ නම්, ඔවුන් සේවයේ ස්ථිර කළ හැකිය.

02. ඉහත සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන සියළුම සේවකයන් ස්ථිර සේවයට පත් කිරීම සඳහා අදාළ පත්කිරීම් බලධාරියා විසින් කටයුතු කළයුතුය.

03. චක්‍රලේඛය නිකුත් කරනුයේ මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිවය.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය